THE INSTITUTE OF CHARTERED ACCOUNTANTS OF SRI LANKA

SUGGESTED SOLUTIONS

03104 - කළමනාකරණය සහ ව්‍යාපාර ආර්ථික විද්‍යාව

ගිණුම්කරණ සහ ව්‍යාපාර සහතික පත්‍ර විභාගය - I
2013 මාර්තු

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය

NOT FOR SALE

ඒ - කොටස

1.	1	11.	2 or 3
2.	4	12.	2
3.	4	13.	3
4.	2	14.	4
5.	2	15.	1
6.	2	16.	3
7.	3	17.	2
8.	2	18.	3
9.	4	19.	3
10.	3	20.	4

NOT FOR SALE

පිළිතුරු අංක 01

(අ) (i) යම් නිශ්චිත භාණ්ඩයක් හෝ සේවාවක් , වෙනත් භාණ්ඩයකට හෝ සේවයකට වඩා අඩු ආවස්ථික පිරිවැයකින් නිපදවීමට ඇති හැකියාව, "සාපේක්ෂ වාසිය" ලෙස දැක්විය හැකිය.

(ii) නිෂ්පාදිත දෙකම සම්බන්ධයෙන්, නිරපේක්ෂ වාසි සහිත රට, "X" වේ.

Y රට 4A නිපදවන විට, X රට 20A නිපදවයි. එනම් පස් ගුණයක නිෂ්පාදනයකි. එසේම Y රට 2B නිපදවන විට, X රට 4B නිපදවයි. එනම් දෙගුණයක නිෂ්පාදනයකි.

(iii) ආවස්ථික පිරිවැය.

	X රට	Y රට
"A" නිෂ්පාදිතයේ ආවස්ථික පිරිවැය B වලින්	0.2B	0.5B
"B" නිෂ්පාදිතයේ ආවස්ථික පිරිවැය A වලින්	5.0A	2.0A

මේ අනුව, X රට, Y රටට වඩා, A නිෂ්පාදිතය අඩු ආවස්ථික පිරිවැයකින් නිපදවයි.

එනම් 0.2B< 0.5B යන තත්වයයි.

(iv) B නිෂ්පාදිතය සම්බන්ධයෙන්, සාපේක්ෂ වාසි ඇත්තේ Y රටටයි. Y රටේ ආවස්ථික පිරිවැය X රටට වඩා අඩුය. එනම් 2.0A<5.0A යන තත්වයයි.

(v) රටවල් දෙකටම, ශ්‍රමිකයන් දෙදෙනෙකු පමණක් සිටිතියි උපකල්පනය කර ගත් විට, රටවල් දෙකම ස්වයංපෝෂිත වීම සඳහා භාණ්ඩ දෙකම නිපදවා ගැනීම සඳහා සමානව ශ්‍රමිකයන් යෙදවීමේදී නිපදවිය හැකි මුළු නිෂ්පාදිතය 24A + 6B වේ. එනම් :

	X රට	Y රට	රටවල් දෙකම
"A" නිෂ්පාදිතය	20 A	4 A	24 A
"B" නිෂ්පාදිතය	4 B	2 B	6 B

රටවල් දෙක සාපේක්ෂ වාසි සැලකිල්ලට ගෙන නිපදවීම කරන්නේ නම් මුළු නිෂ්පාදිතය 40 A+ 4 B වේ. එනම් :

	X රට	Y රට	රටවල් දෙකම
"A" නිෂ්පාදිතය	40 A	-	40 A
"B" නිෂ්පාදිතය	-	4 B	4 B

මේ අනුව, හුවමාරු අනුපාතිකයන් ගත් විට, (40 A+ 4 B) යන්න සැබැවිනම, (24A+ 6B) ට වඩා බෙහෙවින්ම විශාලය.

NOT FOR SALE

(ආ) සම-ආන්තික උපයෝගිතා න්‍යාය යනු, පාර්භෝගිකයෙකු, සිය සීමිත ආදායම, භාණ්ඩ කිහිපයක් සඳහා වැය කිරීමේදී, සිය උපයෝගිතාවය උපරිම වන පරිදි එය සිදුකළ යුතු ආකාරය පැහැදිලි කරන න්‍යායයි.

එහිදී, එකිනෙක භාණ්ඩයට අදාලව ඔහු වැය කරන රුපියලකට අදාල ආන්තික උපයෝගිතාවය සමාන වන පරිදි කටයුතු කිරීමෙන් මුළු උපයෝගිතාවය උපරිම වන ආකාරය, න්‍යායෙන් දැක්වේ.

වැය කරන රුපියලක ආන්තික උපයෝගිතාවය යනු, යම් භාණ්ඩයකින්, යම් මිලක් ගෙවා මිලදී ගනු ලබන ඒකක ලබන ආන්තික උපයෝගිතාවය, එම භාණ්ඩයට ගෙවූ මිලෙන් බෙදීමෙන් ලැබෙන අගයයි.

මේ අනුව , පහත පරිදි, මිලදීගනු ලබන සෑම භාණ්ඩයකම අවසන් ඒකකයෙන් ලබන, රුපියලක **ආන්තික උපයෝගිතාවය සමාන වන පරිදි කටයුතු කිරීමෙන්, මුළු උපයෝගිතාවය උපරිම වේ.**

$$\frac{MU\ (A)}{P(A)} = \frac{MU(B)}{P(B)} = \frac{MU(C)}{P(C)} = \frac{MU(n)}{P(n)}$$

[MU = ආන්තික උපයෝගිතාවය. ; A,B…………..n = අදාල භාණ්ඩ ; P = භාණ්ඩයේ මිල]

(මුළු ලකුණු 12)

NOT FOR SALE

පිළිතුරු අංක 2

(අ) (i) "අනෙකුත් සියළුම සාධක ස්ථාවරව තිබියදී, නිෂ්පාදන ක්‍රියාවලියකට, එක් නිෂ්පාදන සාධකයකින් අතිරේක ඒකකය බැගින් එක් කිරිමේදී, එම විචල්‍ය සාධකය එසේ යෙදවීම මත ලැබෙන ඒ ඒ ඒකකයේ නිමවුම, යම් ලක්ෂයකින් පසු ක්‍රමයෙන් හීනවීම" හීන වන එලදා න්‍යාය නම් වේ.

(ii) " ආන්තික නිෂ්පාදිතය" යනු, අනිකුත් සියළුම සාධක ස්ථාවරව තිබියදී , එක් නිෂ්පාදන සාධයක් පමණක් අතිරේකව යෙදවීමේදී, ඒ එක් ඒකකයකට ලැබෙන අතිරේක නිමවුමේ ප්‍රමාණයයි.

මෙය විකල්ප වශයෙන් පහත පරිදි ද දැක්විය හැකිය.

$$MP = \frac{\Delta Y}{\Delta X}$$ (අනිකුත් සියළුම සාධක ස්ථාවරව තිබියදී)

MP = ආන්තික නිෂ්පාදිතය. (ඒකක වලින්)

ΔX = නිෂ්පාදන සාධකයේ වැඩිකිරිම (ඒකකයකින්)

ΔY = අතරේකව ලැබෙන නිමවුම. (ඒකක වලින්)

(iii) ඉහත නිර්වචනය පරිදි, යම් ලක්ෂයක් දක්වා, මුළු නිමවුම, වැඩෙන අනුපාතයකින් ඉහල යන පරිදි ආන්තික නිෂ්පාදිතය ඉහළ යයි. ඒ ලක්ෂය දක්වා ඒකකයක සාමාන්‍ය නිෂ්පාදන පිරිවැය පහත බසිනු ඇත. යම් ලක්ෂයකින් පසු , ආන්තික නිෂ්පාදිතයේ වැඩිවීම ක්‍රමයෙන් පහත බසී. ඒ අනුව නිෂ්පාදන ඒකකයක සාමාන්‍ය නිෂ්පාදන පිරිවැය වැඩිවීමේ ප්‍රවනතාවයක් දක්වයි. සමස්ථ ඒකක සාමාන්‍ය නිෂ්පාදන පිරිවැය වක්‍රය U අක්ෂරයේ හැඩය ගනී.
(මූලික අදහස දැක්වීම ප්‍රමාණවත්ය.)

සාමාන්‍ය පිරිවැය වක්‍රයේ හැසිරීමට අනුකූලව, ආන්තික නිෂ්පාදන පිරිවැය වක්‍රයේ හැඩය ද තීරණය වේ. එයද ප්‍රථමයෙන් වැඩි වේගයකින් පහතට බැවුම් වී, අදාල ලක්ෂයෙන් පසු, සාමාන්‍ය පිරිවැය වක්‍රයට වඩා වැඩි වේගයකින්, ඉහළට නැඹුරුව විහිදේ. එහිදී, ආන්තික පිරිවැය වක්‍රය, සාමාන්‍ය පිරිවැය වක්‍රයේ අවම ලක්ෂය හරහා ඉහළට විහිදීම සිදුවේ.
(මූලික අදහස දැක්වීම ප්‍රමාණවත්ය.)

(පහත ප්‍රස්ථාරය පරිදි වන පිළිතුරු සදහාද සම්පූර්ණ ලකුණු ලබාදෙන්න.)



ST - MC
ST - AC

[STAC- කෙටිකාලීන සාමාන්‍ය පිරිවැය වක්‍රය, STMC - කෙටිකාලීන ආන්තික පිරිවැය වක්‍රය]

NOT FOR SALE

(ආ) දිගුකාලීන සමතුලිත තාවය :

පූර්ණ තරඟකාරී ආයතනය	ඒකාධිකාරී ආයතනය
(i) සමතුලිත මිල තීරණය වීම	
(අ) සමතුලිතතාවයේදී, AC=MC =MR=P	(අ) සමතුලිතතාවයේදී MC =MR
(ii) උපයන ලාභය තීරණය වීම	
(ආ) ආයතනය ආර්ථික ලාභ නොලබයි. ප්‍රමාණික ලාභ පමණක් ලබයි.	(ආ) P >MC සහ MR නිසා, ආයතනය, ආර්ථික ලාභ උපයා ගනී.
(iii) සම්පත් බෙදා ගැනීමේ කර්යක්ෂමතාවය	
(ඇ) MC =P නිසා, ආයතනය සහ ගැණුම්කරු යන දෙදෙනාම සිය අවශ්‍යතා ඉටු කරගනී. සම්පත් යොදා ගැනීම කාර්යක්ෂම වේ.	(ඇ) MC < P නිසා, ගැණුම්කරු, ඉහල මිලක් ගෙවන නිසා ආර්ථික ලාභ ඉපයේ. සම්පත් යොදා ගැනීම කාර්යක්ෂම නොවේ.
සටහන : නිෂ්පාදිතයක හෝ සේවාවක ආන්තික පිරිවැය, පාරිභෝගිකයා ඒ සඳහා ගෙවීමට සුදානම් මිලට සමාන වන විට, සම්පත් යොදා ගැනීමේ ඉහල කාර්යක්ෂම තත්ත්වයක් පෙන්වයි.	

(ඇ) (i) ආදායමේ වෙනස = රු.75,264 - රු.67,200 = රු. 8,064 එනම් (8064 ÷ 67,200 x 100)
= 12%

ඉල්ලුම් ප්‍රමාණ වෙනස = 504 - 450 = 54 එනම් (54 ÷ 450 x 100) = 12%

ආදායමේ ඉල්ලුම් නම්‍යතාවය = (ඉල්ලුම් ප්‍රමාණයේ වෙනසේ %) ÷ (ආදායමේ වෙනසේ %) = 1

(ii) මෙම භාණ්ඩය සඳහා වන ඉල්ලුම, පාරිභෝගි ආදායමේ සිදුවන වෙනසට සමාන වන පරිදි , ප්‍රතිශතාත්මකව වෙනස් වේ. එම නිසා රාජ්‍ය අංශ / පෞද්ගලික අංශ වැටුප් වැඩිවන අවස්ථාවක් නිදසුනට ගත්විට, එවැනි තොරතුරු සැලකිල්ලට ගෙන, අනිකුත් අදාල සාධක පිලිබඳව ද සලකා බලා නිෂ්පාදනය වැඩි කිරීම එම වැටුප් වැඩිවීම්හි ප්‍රතිශතයෙන්ම සිදුකිරීමට තීරණය කල හැකය.

(මුළු ලකුණු 12)

NOT FOR SALE

<u>පිළිතුරු අංක 03</u>

(අ) (i) නවීන උසස් තාක්ෂණය.

(ii) සේවකයිනට දෙනු ලබන විධිමත් පුහුණුව (ශ්‍රමයේ ගුණාත්මක බව)

(iii) ඉහළ ප්‍රමිතියකින් යුක්ත අමුද්‍රව්‍ය යොදා ගැනීම

(iv) සුදුසු වැඩපල තත්වයන් (proper working environments)

(ආ) (i) ජනගහනයක, එක් පුද්ගලයෙකුට හිමිවන සාමාන්‍ය ආදායම. මෙමගින් බොහෝවිට, යම් රටක ජීවන මට්ටම පිළිබඳ මැන දැක්වීමක් සිදුකෙරේ.

(ii) යම් වර්ෂයක මුළු ජාතික ආදායම, එම වර්ෂයේ මධ්‍ය ජනගහනයෙන් බෙදීම මගින් මෙම ගණනය සිදුකෙරේ. මුළු ජාතික ආදායම වෙනුවට, දළ දේශීය නිෂ්පාදිතය හෝ දළ ජාතික ආදායම යොදා ගැනීමද කළ හැකිය.

(iii) සැසඳීමේ කාර්යය සඳහා, උද්ධමනයේ බලපෑම ඉවත් කිරීම කලයුතුවේ. ඒ සඳහා දළ ජාතික නිෂ්පාදිතය, දළ ජාතික නිෂ්පාදිතයේ අවධමනකය භාවිතයට ගෙන ගැලපීම සිදු කරයි. (GDP Deflator) එමගින් මුල්‍යමය වශයෙන් දැක්වෙන අගයක්, පවතින මිල මට්ටම් පදනමින් මූර්ත අගයක් බවට පරිවර්තනය කෙරේ.

(ඇ) (i) සාර්ව ආර්ථික තත්වයට බලපෑම් සිදුකරන, රජයේ ආදායම් සහ වියදම් ප්‍රතිපත්ති, රාජ්‍ය මුල්‍ය ප්‍රතිපත්ති ලෙස දැක්විය හැකිය. වෙනත් අයුරකින් දැක්වුවහොත් , ජාතික ආර්ථිකයට බලපෑම් සිදුවන පරිදි නිරීක්ෂණාත්මකව, රජයේ වියදම් මට්ටම්හි ගැලපීම් සිදුකරන ආකාරයයි. මෙම ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේ අවසාන අරමුණ අපේක්ෂිත ආර්ථික ඉලක්ක සාක්ෂාත් කර ගැනීමයි.

(ii) (අ) බදු අයකිරීම
(ආ) රාජ්‍ය වියදම්
(ඇ) රාජ්‍ය අයවැය හිඟය
(ඈ) රාජ්‍ය ණය (ණය ගැනීම්)

(iii)(අ) එක් කර්මාන්තයකට බහුවිධ බදු ක්‍රමයක් පැවතීම වෙනුවට ඒකීය බදු ක්‍රමයක් හඳුන්වාදීම වැනි ක්‍රියාමාර්ග වලින් බදු ක්‍රමය සරල කිරීම. උදා : අනුපාතික කිහිපයක් සහිතව පැවති එකතුකල අගය මත අයකෙරෙන බදු ක්‍රමයක් වෙනුවට, 12% ක වූ ඒකාකාර අනුපාතිකයක් හඳුන්වාදීම.

NOT FOR SALE

(ආ) සෘජු විදේශ ආයෝජන සහ පුද්ගලික ආයෝජන නැංවීම සඳහා දිරි ගැන්වීම් සහිත බදු ක්‍රමයක් (Tax incentives) ලබාදීම.

(ඇ) ධීවර , කෘෂි බීජ නිෂ්පාදන වැනි තෝරාගත් අංශ සඳහා වන ආයෝජන මත වර්ෂ 5 ක බදු විරාම හඳුන්වාදීම

.

(ඈ) රුපියල් මිලියන 50 ඉක්මවන ආයෝජන සඳහා වර්ෂ තුනේ බදු විරාම හඳුන්වාදීම.

(ඉ) ඇමෙරිකානු ඩොලර් මිලියන 3 ඉක්මවන ආයෝජන සඳහා වර්ෂ හතේ බදු විරාම හඳුන්වාදීම.

(ඊ) නව ආයෝජන දිරිගැන්වීම සඳහා, නව ක්ෂය දීමනා හඳුන්වාදීම.

(මුළු ලකුණු 12)

<u>පිළිතුරු අංක 04</u>

(අ) (i) (අ) දළ දේශීය නිෂ්පාදිතයේ මුළු වටිනාකම.

(ආ) සේවා නියුක්ති දර්ශක.

(ඇ) පාරිභෝගික මිල දර්ශක.

(ඈ) ගෙවුම් ශේෂයේ තත්වයන්.

(ඉ) පොලී අනුපාත.

(ii)(අ) <u>ගෙවුම් ශේෂ ගැටළුව</u> : කාලයක් තිස්සේ අඛණ්ඩව පවත්නා වෙළඳ ශේෂයේ හිඟය (එනම්: ආයාත හා නිර්යාත අතර වෙනස) සහ රට හේතුවී ඇති වේගයෙන් ඉහළ යන ආනයන වියදම් හමුවේ පසුබැසීම් වලට ලක්වී ඇති අපනයන තත්තවය.

(ආ) <u>අස්ථායී විදේශ විනිමය අනුපාතික තත්වය (Volatile Exchange Rate Situation)</u> - මෙයද ගෙවුම් ශේෂ ගැටලුවටම අදාල වේ. ප්‍රධාන හේතුව ඉහල ආනයන වියදම් සඳහා වන විදේශ විනිමය සඳහා වු ඉහල ඉල්ලුමයි. මෙම තත්වය ආර්ථිකයට අංශ ගණනාවකින් බලපෑම් ඇතිකරයි. උදා: ආනයනය කරන විදේශ යෙදවුම් හි මිලගණන් අධික ලෙස ඉහලයාම.

(ඇ) <u>ඉහළ පොලී අනුපාතිකයන් පැවතීම.</u> මෙම තත්වය ප්‍රාග්ධන පිරිවැය ඉහලයාම හේතුවෙන් නව ආයෝජන වලටත්, ලාභදායිත්වය අඩුවීමෙන් පවත්නා කර්මාන්ත වලටත් අහිතකර බලපෑම් ඇති කරයි.

(ඈ) <u>ඉහල රාජ්‍ය ණය සේවා පිරිවැය</u> - විශේෂයෙන් විදේශ විනිමය අනුපාතිකය ඉහල යාම මත, දේශීය ණයට අමතරව, පියවීමට ඇති විදේශ ණය සඳහා රාජ්‍ය අයවැයෙන් විශාල කොටසක් ප්‍රතිපාදනය කිරීමට සිදුවීමෙන් නව ආයෝජන සඳහා තවදුරටත් ණය ගැනීමට සිදුවීමේ තත්ත්වය.

NOT FOR SALE

(ආ) (i) (අ) රාජ්‍ය සුරකුම්පත් නිකුත්කිරීම මගින් ණය ලබාගැනීම.

(ආ) ජාත්‍යන්තර මුදල් වෙළඳපලෙන් සහ ණය ආයතන වලින් ණය ලබාගැනීම.

(ඇ) ණය ගැනීමට විකල්පයක් ලෙස රජයේ වත්කම් විකිණීම.

(ii) රාජ්‍ය අයවැය හිඟය පියවීම සඳහා ලබාගන්නා සමහර ණය හේතුවෙන්, රටේ මුදල් සැපයුමේ ප්‍රසාරණයක් ඇතිවීමට හේතුවන ද්විතීයික බලපෑම් ඇතිවේ. නිදසුනක් ලෙස, රජය වානිජ බැංකු වලින් ණය ලබාගැනීමේදී, ණය ලබාදීම සඳහා මුදල් මැවීමක් සිදුවන හෙයින් උද්ධමන බලපෑම් ඇතිකරන පරිදි මුදල් සැපයුමේ ප්‍රසාරණයක් සිදුවේ. ශ්‍රී ලංකා මහ බැංකුව රජයේ සුරකුම්පත් මිලදී ගැනීමේදීද මෙම තත්වය ඇතිවේ.

(iii) රාජ්‍ය අයවැය පියවීම සඳහා ලබාගන්නා සමහර ණය වර්ග වලින් ඉහත පරිදි ප්‍රසාරණාත්මක බලපෑමක් ඇති නොවේ. නිදසුනක් ලෙස රජයේ සුරකුම්පත්, මහජනතාව, අර්ථසාධක අරමුදල, ජාතික ඉතිරිකිරීමේ බැංකුව, සේවක භාරකාර අරමුදල වැනි ආයතන වෙත ලබාදීම මගින් රැස් කෙරෙන ණය මගින් මුදල් සැපයුමේ එවැනි ප්‍රසාරණයක් සිදු නොවේ. එහි ඇති වාසිය වනුයේ උද්ධමනාත්මක බලපෑම් එහිදි ජනිත නොවීමයි.

(ඇ) "එකතු කල අගය මත බද්ද" පාර්භෝගික බද්දකි. එහි බදු පදනම, භාණ්ඩයක හෝ සේවාවක ඇති එකතුකළ වටිනාකමයි. එකතුකල වටිනාකම යනු, භාණ්ඩයේ හෝ සේවයේ මිල සහ ඊට අදාල අමුද්‍රව්‍ය පිරිවැය ඇතුළු යෙදවුම්වල පිරිවැය අතර වෙනසයි. මෙය වක්‍ර බද්දකි. ඊට හේතුව බදු ගෙවන නිෂ්පාදකයා, බදු බර නොදරා, එම බදු බර, භාණ්ඩ හා සේවා මිලදී ගන්නා පාර්භෝගිකයන් වෙත විතැන් කිරීම සිදුවන නිසයි.

(මුළු ලකුණු 12)

NOT FOR SALE

පිළිතුරු අංක 05

(අ) සැපයුම් පාර්ශව ආර්ථික විද්‍යාව යනු, සැලසුම් සහගත ලෙස ව්‍යාපාරයන් සඳහා දිරිගැන්වීම් ලබාදීම මගින් වැඩි භාණ්ඩ හා සේවා ප්‍රමාණයක් නිපදවීමක් සිදු කිරීමෙන් සැපයුම් හි වර්ධනයක් ඇති කිරීමෙන් ආර්ථිකය උත්තේජනය කිරීමට ගන්නා ප්‍රතිපත්ති ක්‍රියාමාර්ගයන්ය. උදා : යටිතල පහසුකම් නැංවීම, බදු විරාම ආදය දැක්විය හැකිය.

(ආ) ආර්ථික සංවර්ධනය (Development)

ආර්ථිකයේ ප්‍රමාණාත්මක සහ ගුණාත්මක වෙනස්වීම් වේ. මෙමගින් ජීවන තත්වය ඉහලයාම සහ හිතකර ආර්ථික පරිසරයක් ගොඩ නැංවීම සිදුවේ. කෘෂි ආර්ථිකයන් කාර්මික කරණයට යාමද එවැනි තත්වයන්ය.

ආර්ථික වර්ධනය (Growth)

ආර්ථික ඵලදායිතාවය ඉහලයාම, දළදේශීය නිෂ්පාදනය ඉහළ යාම වැනි තත්වයන්ය. ආර්ථික වර්ධනය හෙවත් ආර්ථික වෘද්ධිය, ආර්ථික සංවර්ධන ක්‍රියාවලියේ එක් අංගයකි.

(ඇ) (i) පවත්නා ශ්‍රම බලකාය,ප්‍රමාණාත්මකව හා ගුණාත්මකව වැඩිවීම.

(ii) මූර්ථ ප්‍රාග්ධනය - යන්ත්‍ර සූත්‍ර - වැඩිවීම හා ඵලදායිතාවය ඉහලයාම.

(iii) සමාජ ප්‍රාග්ධනයේ ආයෝජන ඉහලයාම - යටිතල පහසුකම් වර්ධනය.

(iv) උසස් තාක්ෂණය.

(v) වඩාත් ඉහල මට්ටමේ කළමනාකරණය සහ ඵලදායිතා වර්ධනය සමග සම්පත් අපතේ යාම අවමවීම.

(vi) ආයෝජනයට හිතකර රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති. උදා : බදු සහන, පහල පොලී අනුපාතික , සහනාධාර.

(vii) යහපත් බාහිර ආර්ථික පරිසරයක් තිබීම.

(ඈ) (i) අනුක්‍රම බදු වලින්, ආදායම් ව්‍යාප්ති විෂමතාවය අඩුවේ. උදා : ඉහළ ආදායම් උපයන්නන් වෙතින් වැඩිපුර බදු අයකිරීම.

(ii) එසේ රැස්කරගත් ආදායම්, පහල ආදායම් උපයන්නන් වෙනුවෙන් වියදම් කිරීම මගින් ආදායම්හි ප්‍රති-ව්‍යාප්තියක් සිදුවීම. මෙමගින් සමාජ සාධාරණත්වයක් (Social Justice) ඉටුවේ.

NOT FOR SALE

(iii) සුබෝපභෝගි භාණ්ඩ බදු වැනි බදු වලින් ආර්ථිකයේ භාණ්ඩ පරිභෝජන රටාවේ වෙනසක් ඇති කල හැකිවේ.

(vi) ඍජු බදු විතැන් කල නොහැකි නිසා, ඍජු බදු , වක්‍ර බදු වලට වඩා උද්ධමනයට ඇති කරන බලපෑම අල්ප වේ.

(ඉ) (i) "රාජ්‍ය ණය තිරසාර භාවය" යනු කළමනාකරණය කරගත හැකි මට්ටමකින් රාජ්‍ය ණය තොගය පවත්වා ගැනීමයි. එනම්, ණය කල්පිරීමේදී, ඒ සඳහා වන ගෙවීම් සඳහා රාජ්‍ය ආදායම යෙදවීමෙන් අනිකුත් රාජ්‍ය වියදම් සඳහා දැඩි පීඩනයක් ඇති නොවන තත්වයක් පවත්වා ගැනීමයි. එසේ නොවුවහොත් ප්‍රාගධන වියදම් පහත යාම හෝ ඒ සඳහා තවත් ණය ගැනීම අවශ්‍ය වීම සිදුවිය හැකිය.

(ii) මෙම අනුපාතය මගින්, රාජ්‍ය ණය බර පිළිබඳ චිත්‍රයක් ඉදිරිපත් කෙරේ. අනුපාතය ඉහල යාම යනු ණය බර අධික බවයි. ඒ අනුව සුදුසු අනුපාතයක් පවත්වාගැනීමට ඉන් මගපෙන්වීමක් කරයි.

(මුළු ලකුණු 12)

NOT FOR SALE

<u>පිළිතුරු අංක 06</u>

(අ) පරිසර විශ්ලේෂණය යනු, සංවිධානයේ ක්‍රියාකාරීත්වයට බෙහෙවින් බලපාන අභ්‍යන්තර සහ බාහිර පාරිසරික සාධක පිළිබඳ අධ්‍යයනය කිරීමයි.

උදා : (i) ලෝක ආර්ථික තත්වය - ආර්ථික පසුබෑම සංචාරක කර්මාන්තයට අහිතකර බලපෑම් ඇති කරයි.

(ii) ජාත්‍යන්තර තරඟය.

(iii) රජයේ සංචාරක ප්‍රවර්ධන උපාය මාර්ග.

(iv) රටේ දේශපාලන ස්ථාවරත්වය සහ නීතිය හා සාමය මනාව පැවතීම.

(v) රටේ යටිතල පහසුකම් හි සංවර්ධනයේ ප්‍රමාණය.

(vi) පවත්නා රෙගුලාසි වල ස්වභාවය.

(ආ) (i) ආයතනයේ මෙහෙවර සහ ඉලක්ක (Goals) වෙතින් සාක්ෂාත් කර ගැනීමට ඇති දෑ පිළිබඳ පැහැදිලි දිශාව පෙන්වා දෙයි.

(ii) මෙමගින් හිඟ සම්පත් සහ විකල්ප අවශ්‍යතා අතර මනා ඇගයීමක් සිදුකිරීම මගින්, විවිධ අංශ අතර මනා සම්පත් බෙදා හැරීමකට මඟ පෙන්වයි.

(iii) කාර්ය සාධනය මනා ලෙස ඇගයීමකට ලක්කල හැකිවන පරිදි, පාලන ප්‍රමිති ඇති කර ගැනීමට මෙමගින් මගපෙන්වීමක් සිදු කරයි.

(iv) ඉහල මට්ටමේ ඉලක්ක සහ පහල මට්ටමේ ඉලක්ක අතර ලඟාකර ගත හැකි ප්‍රසශ්ත මට්ටම පිළිබඳ අවබෝධයක් ඇතිකර ගැනීමට උපකාරීවේ.

(v) සිය හැකියාවන් සහ පාරිසරික අභියෝගිතා පිළිබඳ ඇගයීමකට ආයතනය පොළඹවයි. එමගින් ගැටලු ඇතිවූවිට ප්‍රතික්‍රියා දක්වනවා වෙනුවට, ගැටළු ඇතිවීමට ප්‍රථම ඊට මුහුණදීමට සූදානම්ව සිටීමේ හැකියාව වර්ධනය කර ගැනීමට ආයතනයට උපදෙස් ලබාදෙයි.

(ඇ) පටු පාලන අවකාශය: - එක් කළමනාකරුවකු හෝ පරීක්ෂණවරයෙකු අධීක්ෂණය කළයුතු වන යටත් සේවකයන්ගේ ගණන ඉතා අඩු තත්වයයි. මෙමගින් උස්වූ ආයතනික ව්‍යුහයක් ඇතිවේ.

(i) ඉතා ලංවූ අධීක්ෂණය සහ මනා පාලනය.

(ii) යටත් සේවකයන්ගේ ක්‍රියාකාරකම් මනාලෙස සම්බන්ධීකරණය වීම.

(iii) කළමනාකරුවන් අධික ගැටලුවලින් පීඩනයට පත් නොවීම

(iv) වේගවත් තොරතුරු සංනිවේදන හැකියාව සහ එම තත්වය තීරණ ගැනීම් කාර්යය සඳහා වඩා උපකාරීවීම.

NOT FOR SALE

(ඇ) <u>කාර්යක්ෂමතාවය</u> : යම් කාර්යයක් අඩුම කාලයකින් සහ අවම පිරිවැයකින් සම්පූර්ණ කිරීමයි.

<u>සඵලත්වය</u> : ආයතනීය අරමුණු සාක්ෂාත් කර ගැනීමේ මට්ටමයි.

උදා : දෙන ලද කාලයක් තුලදී ඉහල ඒකක ප්‍රමාණයක් නිපදවීම මගින් ඒකක නිෂ්පාදන පිරිවැය අවම වීම කාර්යක්ෂමතාවයයි. එහෙත් පසුව හෙලිවනුයේ එම නිෂ්පාදන වෙළඳපොල ප්‍රමිතින්ට නොගැලපෙන බව නම්, එමගින් අදහස් වනුයේ නිෂ්පාදන ක්‍රියාවලිය සඵලවත් නොවන බවයි.

(මුළු ලකුණු 12)

<u>පිළිතුරු අංක 07</u>

(අ) ජ්‍යෙෂ්ඨ කළමනාකරුවන්ගේ ආචාරධර්මීය හැසිරීම මගින් සමස්ථ ආයතනය වෙත සාධනීය බලපෑමක් ඇතිවේ. එසේ වනුයේ, එම තත්වය හේතුවෙන් යටත් සේවක කණ්ඩායම් ද , ආචාර ධර්මීය හැසිරීම් රටාවකට නැඹුරු වීම ඇතිවීමෙනි. එවිට ඔවුහු යම් සැක කටයුතු යමක් නිරීක්ෂණය කලවිට ඉහලට වාර්තා කිරීම මගින් අයථා ක්‍රියා සිදුවීම පාලනය වේ. මෙම විවෘත සංදේශන තත්ත්වය පැවතීම හේතුවෙන්, කුඩා ආයතනික ගැටලු, දුරදිග ගොස් බරපතල ගැටලු බවට පත් නොවී ආරම්භයේදීම විසදා ගැනීමට මග සැලසේ.

(ආ) (i) රේඛීය ව්‍යුහය (Line Structure) - තීරණ ගන්නන් , කාර්ය මණ්ඩල සමග සෘජුවේම සාකච්ඡා කර තීරණ ගෙන නොපමාව ක්‍රියාත්මක කරයි.

(ii) රේඛීය සහ මාණ්ඩලිය ව්‍යුහය (Line & Staff Structure) මෙය වඩාත් මධ්‍යගත තත්වයකි. රේඛීය කළමනාකරුවන්ට සිය යටත් සේවක මණ්ඩල පිළිබද අධිකාර්ය ඇත. එහෙත් මණ්ඩලික කළමනාකරුවන්ට, රේඛිය කළමනාකරුවන් සහ එම කාර්ය මණ්ඩල පිලිබද අධිකාර්ය නොමැත.

(iii) කාර්යබද්ධ ව්‍යුහය (Functional Structure) - උදාහරණ ලෙස මනා අන්තර් පුද්ගල හැකියා සහිත පුද්ගලයන් ග්‍රාහක සේවා දෙපාර්තමේන්තුවට බදවා ගැනීම.

(vi) භූගෝලීය ව්‍යුහය.

(v) නිලධාර්වාදී සංවිධාන ව්‍යුහය (Bureaucratic Organisational Structure) තීරණ ගැනීම ඉහල සිට පහලට ක්‍රියාත්මක වේ.

(vi) ජාලමය (Network)

(vii) මිශ්‍ර සංවිධාන ව්‍යුහයන් - ඉහත ව්‍යුහයයන්ගේ සංයුතියක් ලෙසවූ සංවිධාන ව්‍යුහයන්.

(ඈ) වාණිජ බැංකුවකට අදාලව රේඛීය කාර්යයන්, බැංකුවේ මූලික කාර්යයන්ට අදාල වේ. එනම් බැංකු ක්‍රමයට අදාල කාර්යයන්ය. උදා: තැන්පතු භාරගැනීම, ණය දීම, අත්තිකාරම් දීම, ණයවර ලිපි විවෘත කිරීම ආදිය.

මාණ්ඩලික කාර්යයන්, බැංකුවේ මනා ක්‍රියාකාරිත්වය සඳහා අවශ්‍ය වන අනිකුත් විශේෂඥ ස්වභාවයේ කාර්යයන්ට අදාල වේ. උදා: ගිණුම්කරණ සහ මූල්‍ය ප්‍රකාශ සැකසීම් සේවාවන්, තොරතුරු තාක්ෂණ සේවාවන්.

(ඈ) (i) බොහෝ පුද්ගලයින් වැඩ කිරීමට, අකමැති පුද්ගලයෝ නොවෙති. වැඩ කිරීම ස්වාභාවික වූ කාර්යයකි.

(ii) මිනිසුන් තමා හා බැඳී ඇති ඉලක්ක වෙත ළඟාවීම සඳහා ස්වයං මඟ පෙන්වීමක් සහ ස්වයං පාලනයක් ඇතිකර ගනී.

(iii) ඉලක්ක ළඟාකර ගැනීමට ඇති වගකීම, ඒ සඳහා ලැබෙන ප්‍රතිලාභ වල ශ්‍රිතයකි. එසේ ලැබෙන ප්‍රතිලාභ වෙතින් තමා පිළිගැනීමේ තත්වයට පත්වීම සපුරා ගනී. (Satisfy esteem needs)

(iv) පරිසරය යහපත් වන විට, සාමාන්‍ය පුද්ගලයන්, වගකීම් භාරගන්නවා පමණක් නොව වගකීම් සොයා යන්නන් ලෙසද කටයුතු කරති.

(v) බොහෝ පුද්ගලයින්ට, ආයතනික ගැටළු විසඳීමේ නිර්මානාත්මක සහ නවතම හැකියාවන් ඇත.

(vi) බොහෝ ආයතනවල සටින පුද්ගලයන්ගේ බුද්ධිමය හැකියාවන්ගෙන් සැබැවින්ම ප්‍රයෝජනයට ගැනෙනුයේ අර්ධ වශයෙනි.

(මුළු ලකුණු 12)

නිවේදනය

මෙහි ලබාදුන් පිළතුරු ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය මගින් (ශ්‍රී ලංකා ව.ග.) පමණක් ලබාදෙන ලද අතර, එම පිළිතුරු ඔබ විසින් එය "එසේම" යන පදනම මත පිළිගත යුතු වේ.

එම පිළිතුරු "ආදර්ශ පිළිතුරු" ලෙස අදහස් නොකරන නමුත් ඒවා බොහෝදුරට suggested solution ලෙස දැක්වේ.

පිළිතුරු වලින් පධාන අරමුණු දෙකක් ඉටුකෙරේ. ඒවා නම්,

01. විභාග ප්‍රශ්නයකට යෝජිත විසඳුමක් සඳහා සවිස්තරාත්මක නිදසුනක් (උදාහරණයක්) සැපයීම සහ,

02. ශිෂ්‍යයන්ට විෂය පිළිබඳව තොරතුරු පර්යේෂණය කිරීම සඳහා අත්වැලක් සැපයීම සහ විෂය පිළිබඳව ඔවුන්ගේ අවබෝධය සහ අගය වර්ධනය කිරීම.

    මෙම යෝජිත විසඳුම් සම්බන්ධයෙන් ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය (ශ්‍රී ලංකා ව.ග.) කිසිඳු ප්‍රතිඥාභාරයක් ලබා නොදෙන නිසා ඒ සම්බන්ධව කිසිඳු අගතියකට පත්වීමක් පිළිබඳව මැසිවිල්ලක් ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයට (ශ්‍රී ලංකා ව.ග.) එරෙහිව ඉදිරිපත් කිරීමට ඔබ හට හේතුවක් නොමැත. ඒ කෙසේ වෙතත් ඔබ විසින් යම් නඩුකරයක්, වන්දි ඉල්ලීමක්, පෙත්සමක්, තර්ජනය කිරීමක් හෝ බලවත් ඉල්ලීමක් ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයට (ශ්‍රී ලංකා ව.ග.) එරෙහිව ගොනුකරනු ලැබ එයින් සැලකියයුතු අන්දමේ ජයග්‍රහණයක් ලබා නොගතහොත් ඔබ විසින් එම නඩුකරයට අදාළ සම්පූර්ණ නෛතික ගාස්තු සහ වියදම් ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයට (ශ්‍රී ලංකා ව.ග.) ගෙවිය යුතු වේ. එනයින්ම මෙම අයිතිවාසිකම හෝ මෙහි විස්තර කෙරෙන හෝ ශ්‍රී ලංකාවේ නීතීන් යටතේ හිමි වෙනත් අයිතිවාසිකම් බලාත්මක කරවා ගැනීම සඳහා ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයට (ශ්‍රී ලංකා ව.ග.) නෛතික ක්‍රියාමාර්ගයකට යොමුවීමට සිදුවුවහොත්, ඊට අදාළ නෛතික ගාස්තු සහ වියදම්ද ඔබ විසින් ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයට (ශ්‍රී ලංකා ව.ග.) ගෙවිය යුතුවේ.

[2] 2013 ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය (ශ්‍රී ලංකා ව.ග.) මගිනි.
සියළුම හිමිකම් ඇවිරිණි.

මෙම ලේඛණයේ කිසිම සටහනක් ප්‍රතිඋත්පාදනය කිරීම, කුමන හෝ ආකාරයකින් හෝ ක්‍රමයකින් එනම්, ඉලෙක්ට්‍රොනික, යාන්ත්‍රික, ඡායා පිටපත් කිරීම, වාර්තාගත කිරීම හෝ වෙනත් ක්‍රමයකින් සම්ප්‍රේෂණය කිරීම ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ (ශ්‍රී ලංකා ව.ග.) පූර්ව ලිඛිත අවසරයකින් තොරව සිදු නොකළ යුතුය.